රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක :07/2008

මගේ අංකය : ආ 5/1/22
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2008.02.15

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ වැටුප් සංශෝධනය කිරීම

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III, II හා I ශ්‍රේණි සඳහා 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 මගින් නියම කර ඇති වැටුප්, ජාතික වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාව මගින් නිර්දේශිත පහත සඳහන් විධිවිධාන අනුව සංශෝධනය කිරීමට රජය තීරණය කර ඇත.

(i) ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව යටතේ උපලේඛනගත කර ඇති තනතුරු අතරින් ඡායාරූප ශිල්පී සහ සංදේශ නිලධාරී යන තනතුරු හැර අනෙකුත් තනතුරුවල III, II හා I ශ්‍රේණි සඳහා, 2006.01.01 දින සිට එම්එන්-3-2006 වැටුප් කේත අංකය යටතේ රු. 14510-4x150-6x205-20x290-11x320-25660 වැටුප් පරිමාණය, පියවරට පියවර තැබීමේ පදනම මත හිඟ වැටුප් රහිතව අදාල කිරීම.

(ii) ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව යටතේ උපලේඛනගතව තිබෙන ඡායාරූප ශිල්පී සහ සංදේශ නිලධාරී යන තනතුරුවල රාජකාරී ස්වභාවය අධ්‍යයනය කර අවසන් නිර්දේශයක් කරන තෙක්, 2006.01.01 දින සිට එම තනතුරුවල III, II හා I ශ්‍රේණි සඳහා, එම්ටී-3-2006 වැටුප් කේත අංකය යටතේ රු. 14420-10x140-11x150-6x210-14x290-22790 වැටුප් පරිමාණය, පියවරට පියවර තැබීමේ පදනම මත හිඟ වැටුප් රහිතව අදාල කිරීම.

(iii) ඉහත (i) හා (ii) යටතේ සඳහන් තනතුරු සඳහා පිළිවෙලින් 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (IV) න් සංශෝධිත එම්එන්-3-2006 ඒ සහ එම්ටී-3-2006 ඒ වැටුප් කේත අංක යටතේ වන පහත සඳහන් වැටුප් පරිමාණයන්, එකී චක්‍රලේඛයේ විධිවිධාන පරිදි 2007.06.01 දින සිට අදාල කිරීම සහ <u>ඒ අනුව 2008.06.01 දින සිට වැටුප් ගෙවීම.</u>

| | |
|---|---|
| එම්එන්-3-2006 ඒ | රු. 15005-4x180-6x240-11x320-20x360-27885 |
| එම්ටී-3-2006 ඒ | රු. 14910-10x170-11x180-6x240-14x320-24510 |

(iv) 2006.01.01 දිනට පසුව 2008.05.31 දක්වා කාලය තුළ විශ්‍රාම ලැබූ/ලබන නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප්; විශ්‍රාම ලැබූ/ලබන දිනට අදල වන වැටුප් පරිමාණය අනුව හිමිකම් ලබන වැටුප මත සංශෝධනය කර, <u>ඒ අනුව 2008.06.01 දින සිට සංශෝධිත විශ්‍රාම වැටුප් ගෙවීම.</u>

02. 2006.01.01 දින සිට 2008.05.31 දක්වා කාලයට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 සහ 06/2006 (IV) අනුව එම්ටී-2 කේත අංකයට අදාලව හිමිකම් ලබන වැටුප් පරිමාණ මත වැටුප් ගෙවිය යුතු අතර, ඉහත (i) සිට (iv) දක්වා උප වගන්ති අනුව අවශ්‍ය කටයුතු කර 2008.06.01 දින සිට ගෙවීම් සිදු කිරීමට පියවර ගැනීම මැනවි.

03. මහා භාණ්ඩාගාරයේ එකගත්වය මත මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය